# දුල්ලෑව වලව්ව හෙවත් වත්මන් රජිණි හෝටලයේ සුවිශේෂ වාස්තු විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**එම්.එස්.එන්. විජේසිරි[1]**

මුඛ්‍ය පද: දුල්ලෑව වලව්ව, මහනුවර, රජිණි හෝටලය, වාස්තු විද්‍යාව, ශ්‍රී ලංකාවේ වලව්

## හැඳින්වීම

රජිණි හෝටලය යනුවෙන් අද හඳුන්වනු ලබන්නේ අතීත මහනුවර රාජධානි සමයේ සිටි දුල්ලෑව අදිකාරම්ට අයත් වූ එම වලව්ව යි. මෙය මහනුවර වත්මන් දළදා වීදිය සහ ඩී.එස්.සේනානායක වීදිය, නුවර වැව එකට හමුවන ස්ථානයේ පිහිටා ඇත. ක්‍රි.ව. 1815 දී බ්‍රිතාන්‍යයන් උඩරට අත්පත් කරගත් අතර ක්‍රි.ව. 1840 දී මෙකී ගොඩනැගිල්ල හමුදා නිල නිවසක් බවට පත්විය. එමෙන්ම ක්‍රි.ව. 1873-1874 කාලයේ දී පියෂෝ මැතිණිය හෝටලයක් ආරම්භ කිරීම සඳහා ගොඩනැගිල්ල මිලදී ගත් අතර ක්‍රමක්‍රමයෙන් වලව්වේ මුල් ස්වරූපය වෙනස් වෙමින් බ්‍රිතාන්‍ය වාස්තු විද්‍යාත්මක ලක්ෂණ එක් විය. මහනුවර රජිණි හෝටලයේ දක්නට ලැබෙන සුවිශේෂී වාස්තු විද්‍යාත්මක ලක්ෂණ මොනවා ද? යන ගැටළුව මූලික කරගනිමින් මෙම පර්යේෂණය සිදු කරනු ලබන අතර මෙහි අරමුණ වන්නේ දෙස් විදෙස් සංචාරකයින්ගේ අවධානය දිනාගත් රජිණි හෝටලය සතු දේශීය සහ බ්‍රිතාන්‍ය සංස්කෘතීන්ගේ සම්මිශ්‍රණයක් වූ සුවිශේෂී වාස්තු විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳව අධ්‍යයනය කිරීමත් එකී ලක්ෂණවල වටිනාකම සමාජගත කිරීමත්ය.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණය සිදු කිරීමේ දී අවධානය යොමු කරන ලද්දේ රජිණි හෝටලයේ සුවිශේෂී වාස්තු විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳව ය. මෙහි දී දත්ත ලබා ගැනීම සඳහා ප්‍රධාන වශයෙන් ප්‍රාථමික දත්ත සහ ද්විතීක දත්ත භාවිතයට ගන්නා ලදී. දත්ත ලබා ගැනීම සඳහා මූලික වශයෙන් ක්ෂේත්‍ර ගවේෂණය සහ මහනුවර ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලයේ පුරාවිද්‍යා නිලධාරීන් සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡා මගින් තොරතුරු රැස් කළ අතර ඊට අමතරව සාහිත්‍ය මූලාශ්‍ර, සඟරා පරිශීලනය සහ පුවත්පත් අධ්‍යයනය කිරීම, සිතියම්, ඡායාරූප ආදී ක්‍රම ඔස්සේ දත්ත හා තොරතුරු රැස් කරන ලදී. මෙහිදී වලව්වේ වාස්තු විද්‍යාත්මක නිර්මාණ ශිල්පය විශ්ලේෂණය කරනු ලබන අතර එම නිර්මාණයන් පරිසරය සමග මනාව සම්බන්ධ වීම මගින් අලංකාරත්වය, පාරිසරික සහ සංස්කෘතික අගය වර්ධනය වීම පිළිබඳව විශ්ලේෂණය කෙරේ.

---

[1] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය
sanduniwijesiri1998@gmail.com

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

වලව්වක් ඉදිකිරීමේ දී එහි ගාම්භීරත්වය, ප්‍රභූත්වය, නිවසේ කල් පැවැත්ම, ඉඩම් මනාව කළමනාකරණය කිරීම යන කාරණයන් මූලික කර ගනිමින් නිවස ඉදිකර ඇත. පැරණි වලව්වක් වන රජිණි හෝටලයේ ප්‍රධාන පිවිසුමෙන් ඇතුල් වීමේ දී එහි ජීවත් වූ ප්‍රභූවරුන්ගේ පෞරුෂත්වය පෙන්නුම් කිරීම විශේෂත්වයකි. ප්‍රධාන පිවිසුම ඉදිකර ඇති භූමියට වඩා මදක් ඉහළින් නිවස ඉදිකර ඇති අතර මෙයින් නිවසේ ගාම්භීරත්වය පෙන්වීමට උත්සහගත් බවක් පෙනී යයි. භූමි නිර්මාණය ගත්විට දූල්ලෑව වලව්ව උසස් භූමි නිර්මාණ ලක්ෂණයන්ගෙන් යුක්ත වන අතර ඉඩමට ප්‍රවිශ්ට වීමේ දී නිවසේ ගාම්භීරත්වය, ප්‍රභූත්වයක් නිවසට ගමන් කරන ඕනෑම අයෙකුට භූමි නිර්මාණය තුළින් නෙත ගැටේ. භූමි නිර්මාණය අනුව වාස්තු විද්‍යාවත් ඒ අනුව භූමි නිර්මාණයත් සිදුකර ඇත. භූමි නිර්මාණය තුළින් නිවසේ ජීවත්වන පුද්ගලයින්ගේ ස්වභාවය, සමාජ පන්තිය, කුලයේ උසස් බව ආදී කාරණයන් බොහෝමයක් නෙත ගැටේ.

එමෙන් ම වාතාශ්‍ර පද්ධතිය සඳහා වාස්තු විද්‍යාවේ දී බහුලව නිර්මාණය කරනු ලබන අංගය වන්නේ මැද මිදුලයි. මෙය මහනුවර යුගයේ වාස්තු විද්‍යාවේ විශේෂිත වූ වාස්තු විද්‍යාත්මක නිර්මාණයක් බවට පත්වන නිසාම දූල්ලෑව වලව්ව තුළ මෙය විශේෂිත වූ අංගයක් ලෙස පවතී. පරිසරයේ ඇති පිරිසිදු වාතය වලව්ව ඇතුළට ගමන් කරන අතර නිවස අභ්‍යන්තරයේ ඇති රත් වූ අපිරිසිදු වාතය මැද මිදුලෙන් ඉහළට ගමන් කරයි. එවිට නිවස අභ්‍යන්තර සිසිලස රැක දේ. එමගින් වාතාශ්‍රය සංසරණය වීම සිදු වේ. නිවස අභ්‍යන්තර අපිරිසිදු වාතය නිවසින් පිටතට ගමන් කිරීමත්, නිවස  පිටත ඇති අපිරිසිදු වාතය නිවස අභ්‍යන්තරයට ගමන් කිරීමත්, නිවස අභ්‍යන්තර සිසිලස වාතය රැකදීමත් මේ තුළ නිරන්තරයෙන් සිදු වේ.

මෙහි තවත් සුවිශේෂී වාස්තු විද්‍යාත්මක ලක්ෂණයක් වන්නේ වා කවුළු නිර්මාණයේ දී වෘත්තාකාර සහ හතරැස් ආකාරයෙන් ඍජුකෝණාස්‍රාකාරයෙන් වා කවුළු නිර්මාණය කර තිබීම යි. ඇතම් විට මෙම සුළං කවුළු සඳහා රාමු, කැටයම් ආදී නිර්මාණයන් සිදු කරන්නට ඇත්තේ සතුන්ගෙන් සිදුවන හානියත්, පාරිසරික හා භෞතික වශයෙන් සිදුවන හානියත් අවම කර ගැනීමේ පරමාර්ථයෙන් විය හැකිය. මෙම වා කවුළු හරහා ද පිරිසිදු වාතාශ්‍රය සංසරණය වීම සිදු වේ. වාතාශ්‍ර පද්ධතියට අයත්වන තවත් වාස්තු විද්‍යාත්මක අංගයක් බවට විශාල දොරවල් සහ ජනෙල් අයත් වේ. මෙමගින් ද නිවස අභ්‍යන්තර සිසිලස පාලනය කරනු ලබයි.

මේවන විට දිස්වන්නේ බ්‍රිතාන්‍ය ගෘහ නිර්මාණ ශිල්පයට අනුව ඉදිකරන ලද රජිණි හෝටලය වන අතර දූල්ලෑව වලව්ව හෙවත් රජිණි හෝටලයේ ද ලැටිස් නිර්මාණය කර ඇති අතර එය භාවිතා කර ඇත්තේ ද මැද මිදුලට ආනතව ඉදිකර ඇති පියස්සෙහි බර දරා සිටීමට නිර්මාණය කර ඇති කුළුණු අතර හිස් අවකාශය පිරවීමට ය. එමෙන්ම ලැටිස් නිර්මාණය මැද මිදුලට වර්ෂා කාලයේ පතිතවන ජලයත්, උෂ්ණාධික කාලයේ පතිතවන අධික අව් රශ්මිය නිවස අභ්‍යන්තරයට

ගමන් කිරීම වැළැක්වීම සහ නිවස අභ්‍යන්තර අලංකරණය පිළිබඳ සැළකිලිමත් වූ නිසාත් ඉදි කරන්නට ඇත.

මෙම ගොඩනැගිල්ල එහි පාදමට හානි නොවන ආකාරයට පොළොව තුළට ගිල්වන යකඩ බාල්ක ආකෘතියක් සෑම බිත්තියකටම පහළින් සමබර කර ඉදි කරන ලදී. ඉදිකර තිබෙන බිත්තිවල අභ්‍යන්තර නොපෙනුනත් ක්‍රි.ව. 1998 දී ත්‍රස්තවාදීන් විසින් දළදා මාළිගාවට ඉලක්ක කර ගනිමින් එල්ල කරනු ලැබූ බෝම්බ ප්‍රහාරයෙන් සිදු වූ කම්පනයෙන් ගොඩනැගිල්ලේ කුලුණක බදාම ගැලවී ගිය අතර එම අවස්ථාවේ දී මෙම ගොඩනැගිල්ලේ වාස්තු විද්‍යාත්මක ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරන ලදී. එහි දී දක්නට ලැබී ඇත්තේ ගල්, ගඩොල් සහ විශේෂිත බදාමයක් යොදා ගනිමින් පදම් කළ මැටි, මිනිරන් සහ ලාටු විශේෂයක් භාවිතා කර ගොඩනැගිල්ල ඉදිකර ඇති බවයි (තිලකරත්න 2021).

මෙම ගොඩනැගිල්ලෙහි ඝනකම 5cm පමණ වන අතර අභ්‍යන්තර සිසිල ආරක්ෂා කිරීමටත්, උෂ්ණත්ව පාලනයටත් සමත් වේ. ගොඩනැගිල්ලේ ඇතැම් ස්ථානවල ඝනකම 5cmට වඩා පුළුල් බිත්ති බැඳීමේ දී සිදුරු පිහිටන ලෙස ගල් අල්ලා තිබීම දිස්වේ. ඊට ප්‍රධානතම හේතුව බිත්ති ප්‍රසාරණයට සහ සංකෝචනයට ඔරොත්තු දීමයි.

## සමාලෝචනය

උඩරට රාජධානි සමයේ බිහි වූ වාස්තු විද්‍යාත්මක නිර්මාණයන් අතරින් විශේෂිත නිර්මාණයක් බවට පත්වන්නේ උඩරට ප්‍රභූ පිරිස් විසින් ඉදි කරන ලද වලව් නමැති වාස්තු විද්‍යාත්මක නිර්මාණයන් ය. එසේ බිහි වූ වලව් අතරින් දූල්ලෑව වලව්ව වාස්තු විද්‍යාත්මක ලක්ෂණයන්ගෙන් පොහොසත් ස්ථානයකි. බ්‍රිතාන්‍යයන් විසින් අත්පත් කර ගැනීමෙන් අනතුරුව බ්‍රිතාන්‍ය වාස්තු විද්‍යාත්මක ලක්ෂණ ද එක් වී වත්මන් රැජිණි හෝටලය නිර්මාණය වූ අතර මහනුවර නගරයේ දක්නට ලැබෙන අගනා වාස්තු විද්‍යාත්මක ලක්ෂණ රැසකට උරුමකම් කියන ඉදිකිරීමක් ලෙස දැක්විය හැකි ය.

## ආශ්‍රිත මූලාශ්‍රය

අලුත්වත්ත, පී.එම්. (2008). ***ශ්‍රී ලංකාවේ ලන්දේසි ගෘහ නිර්මාණ සම්ප්‍රදාය***. මුදුන්ගොඩ:

තරංග ප්‍රකාශකයෝ.

ඔබේසේකර, එම්. (2006). ***ශ්‍රී ලංකාවේ වලව් නාමාවලිය***. ජා ඇල: සමන්ති පොත් ප්‍රකාශකයෝ.

හේරත්, එච්.එම්.ඩී.ආර්, විජේසිරි, එන්. (2016). ***දළදා සංස්කෘතිය***. (මාර්ගගත), එකොළොස්වන කළාපය https://www.researchgate.net/publication/.